**බුද්ධශාසන අරමුදල - 2017**

---

බුද්ධශාසන අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව 1990 අංක 35 දරන බුද්ධශාසන අරමුදල පනතේ 12 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. බුද්ධශාසන අරමුදල පනතේ 12 (4) වගන්තිය ප්‍රකාර ඉදිරිපත් කළ යුතු 2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 ඔක්තෝබර් 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ අරමුදලේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

---

**2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---

1990 අංක 35 දරන බුද්ධශාසන අරමුදල පනතේ 12 (1) වගන්තිය අනුව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු 2016 හා 2017 වර්ෂ සඳහා වූ අරමුදලේ මූල්‍ය ප්‍රකාශන 2018 ඔක්තෝබර් 31 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**2.2 වත්කම් හා වගකීම් වල පැවැත්ම**

---

අරමුදල විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2015 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **මූල්‍ය ප්‍රකාශන අයිතමය** | **වටිනාකම** |
|---|---|
| | **රු.** |
| ස්ථාවර වත්කම් | 10,571,873 |
| ආයෝජන | 483,124,345 |
| ශුද්ධ ජංගම වත්කම් | 34,550,797 |
| **එකතුව** | **528,247,015** |
| **මෙයින් නියෝජනය වන්නේ** | |
| බුද්ධශාසන අරමුදල | 512,425,953 |
| විවිධ පරිත්‍යාග | 14,472,266 |
| සුනාමි ආධාර | 1,348,796 |
| **එකතුව** | **528,247,015** |

| | |
|---|---|
| මුළු ආදායම | 34,403,622 |
| මුළු වියදම | (6,458,049) |
| | ---------------- |
| **අතිරික්තය** | **27,945,573** |
| | ======== |

**2.3 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

විගණනයේදී නිරීක්ෂණය වූ නීති රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| **නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) 1990 අංක 35 දරන බුද්ධශාසන අරමුදල පනතේ 8 (ආ) වගන්තිය. | ආයෝජනවලින් ලැබෙන සියලු ආදායම් ශ්‍රී ලංකා මහ බැංකුවේ විවෘත කර ඇති ජංගම ගිණුමට බැරකළ යුතු වුවත් ආදායම් එම ගිණුමට බැර කිරීමෙන් තොරව අදාළ ආයෝජනයටම නැවත එකතු කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය. |
| (ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 395 (ඇ) | බැංකු ගිණුමක් ඇති සෑම ආයතනයක් විසින්ම එක් එක් මාසය අවසානයේදී ඇති ගනුදෙනු සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 වෙනි දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කළ යුතු වුවත් අරමුදල විසින් 2017 වර්ෂයේ ජූලි මාසයේ සිට දෙසැම්බර් 31 දක්වා බැංකු සැසඳුම් ප්‍රකාශන විගණන අවස්ථාව වූ 2018 ඔක්තෝබර් 31 දින වන විටත් සකස් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 756, 757 හා 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර නොතිබුණි. |
| (ඇ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ් 423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.2 (ඇ) ඡේදය. | බැංකු ගිණුම් නිතිපතා සසදා කාර්තු වශයෙන් වාර්තා සකස් කර රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

**3.1.1 සැලසුම් කිරීම**

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණද පාලක මණ්ඩලය විසින් ගන්නා ලද තීරණ වලට අනුව, ක්‍රියාකාරී සැලැස්මේ අදාළ සංශෝධනයන් සිදු කර නොතිබුණි.

**3.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව පිරිවැය රු.30,825,000 ක ව්‍යාපෘති 8 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. එයින් සමාලෝචිත වර්ෂය තුල ආරම්භ කර පැවතියේ පිරිවැය රු.4,000,000 ක්වූ ව්‍යාපෘති 3 ක් පමණි.

(ආ) සාමනේර ආයතන 13 ක් සඳහා මාස 156 කට අදාළව ගෙවීම් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුල මාස 130 කට අදාළ ගෙවීම් පමණක් කර තිබුණි. සියලුම නිකායන්ට හා පාර්ශවයන්ට අයත් විහාරස්ථානවල සාමනේර ආයතන 100 ක් ඇති කිරීම සඳහා බුද්ධශාසන අරමුදලේ පාලක මණ්ඩලය ඉලක්ක කර තිබුණද 2016 වසරේ ලියාපදිංචි කර තිබූ සාමනේර ආයතන ප්‍රමාණය 16 ක් වූ අතර එය 2017 වසර වන විට 13 දක්වා අඩුවී තිබුණි.

**3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

---

බුද්ධශාසන අරමුදලේ සමාලෝචිත වර්ෂයේ මුළු ලැබීම් රු.25,923,838 ක්වූ අතර උක්ත වර්ෂය තුළ ව්‍යාපෘති හා පරිපාලන වියදම් රු.11,748,870 ක් විය. මින්ද අරමුදලේ අරමුණුගත කාර්යයන් සඳහා යොදවාගෙන පැවතියේ රු.10,971,040 ක් ලෙස ලද ආදායමෙන් සියයට 42 ක් පමණක් විය. මෙලෙස අතිරික්ත වන මුදල් ආයෝජනය කර පැවති අතර 2015 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය වාර්තාවට අනුව මුළු ආයෝජන රු.483,124,345 ක් විය. ආයෝජනවලින් වාර්ෂිකව අරමුදලට ලැබිය යුතු අවම පොලියට සරිලන අන්දමේ වැඩසටහන් හෝ ක්‍රියාත්මක කිරීමට අරමුදල අපොහොසත් වී තිබුණි.

**3.3 කාර්ය මණ්ඩල පරිපාලනය**

---

බුද්ධශාසන අරමුදල පනතේ 11 වගන්තිය අනුව සුදුසු නිලධාරීන් හා සේවකයන් බඳවා ගැනීම ද ඔවුන්ගේ පාරිශ්‍රමික බුද්ධශාසන අරමුදලේ ආදායමින් ගෙවීමද කළ හැකි වුවත්, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම සේවක මණ්ඩලයක් බඳවා ගෙන නොතිබුණි. අරමුදලේ කටයුතු සඳහා බුද්ධශාසන අමාත්‍යාංශයේ නිලධාරීන් සිව් දෙනෙකු අනුයුක්ත කර අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ රු.1,326,072 ක වැටුප් සමාලෝචිත වර්ෂය සඳහා ගෙවා තිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය**

---

**4.1 අභ්‍යන්තර විගණනය**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 133 (ආ) සහ 2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009 (1) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාර අරමුදලේ අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුව තිබුණද සමාලෝචිත වර්ෂයේදී අරමුදල සඳහා අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

**4.2 අයවැය ලේඛනමය පාලනය**

---

2006 දෙසැම්බර් 22 දිනැති පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1 පරිදි අරමුදලේ අරමුණුවලට අනුකූලව අයවැය ලේඛනයක් සකස් කර ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් හා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන, ඒ අනුව වියදම් දැරිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.